THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

**GMOA**

ESTABLISHED IN 1926
TU No. 291

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2013/09/27

## මාධ්‍ය නිවේදනයයි

රජයේ සේවකයින් නගරාසන්නව සේවය කිරීමට කැමති අතර දුර බැහැර සහ දුෂ්කර ප්‍රදේශවල සේවය කිරීමට අකමැතිය. ලංකාවේ පමණක් නොව අනෙකුත් රටවලද මෙම තත්ත්වය පවති.

නමුත් ලංකාවේ වෛද්‍යවරු හිග වුවත් සිටින වෛද්‍යවරු සංඛ්‍යාව ප්‍රධාන රෝහල්වලට මෙන්ම දුර බැහැර අනිකුත් රෝහල් වලටද ලබා දීමට හැකියාව ලැබී ඇත්තේ වෛද්‍ය ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තියක් නියමාකාරයෙන් ක්‍රියාත්මක වීමෙනි.

මේ හේතුවෙන් ගුණාත්මක සෞඛ්‍ය සේවාව රට පුරා සමානාත්මව බෙදී යාමට අවස්ථාව සැලසේ. යුධමය වාතාවරණයකදී යුද්ධය පවතින ප්‍රදේශවල සෞඛ්‍ය සේවාව පවත්වාගෙන යන්නේ රාජ්‍ය නොවන සංවිධානයි. නමුත් ලංකාවේ යුද්ධය පවතිද්දී රජයේ වෛද්‍යවරු එම ප්‍රදේශවලට අනුයුක්ත කර සේවාවන් පවත්වාගෙන යෑම ලෝකයටම ආදර්ශයකි.

නමුත් පසුගිය වසර කිහිපයක් තිස්සේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අකාර්යක්ෂමතාවය නිසා මාරුවීම් ප්‍රතිපත්තිය නිසි පරිදි ක්‍රියාත්මක නොවීය. එම හේතුවෙන් දුෂ්කර ප්‍රදේශවල රෝහල් වලට යායුතු වෛද්‍යවරු කොළඹ, ගාල්ල වැනි ප්‍රධාන රෝහල් වල රැදෙනු දක්නට ලැබුණි. මේ තත්ත්වය නිවැරදි කර රටපුරා සමසේ වෛද්‍යවරු ලබාදීමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සෞඛ්‍ය අමාත්‍යාංශය හා දැඩි පරිශ්‍රමයක් දරමින් සිටී. නමුත් මෙයට බාධා කරන අයුරු පැහැදිලිව දක්නට ඇත. 2012 වසරේදීද, මේ කාරණය පිලිබඳව මාධ්‍යවේදීන්ගේ උපකාරයෙන් කොළඹ ජාතික රෝහලේ ප්‍රශ්න ඇති වන බව මාධ්‍ය මගින් හුවා දැක්වූ අප සිහිපත් කරමු. නමුත් කොළඹ ජාතික රෝහල් වෛද්‍යවරු අදාල ස්ථාන වලට නිසි ලෙස මුදා හැරුනු අතර කිසිදු බලපෑමක් සිදු නොවිනි. දැන් කලුබෝවිල ඇතුලු රෝහල් කිහිපයක වෛද්‍යවරුන් කිහිප දෙනෙක් මාධ්‍ය වලට සාවද්‍ය තොරතුරු සපයමින් සිටී. මාධ්‍ය මගින් ගෙන යන මෙම ප්‍රචාරයට අප දේශපාලඥයින් අනුගත වුවහොත් මාධ්‍ය ආවරණය නැති දුෂ්කර ප්‍රදේශවල රෝහල්වල වෛද්‍යවරුන්ගේ හිගයක් ඇති වනු ඇති අතර ඒවායන් සේවය ලත් අසරණ ජනතාව තවත් කරදරයකට පත්වීම වැලැක්විය නොහැක.

එබැවින් ප්‍රධාන රෝහල් වලට මෙන්ම දිවයින පුරා විසිරි කුඩා රෝහල් වලට එකසේ සලකන වෛද්‍යවරුන්ගේ මාරුවීම් ප්‍රතිපත්තිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍ය බව අප අවධාරනයෙන් සිහිපත් කරමු.

ස්තුතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර -

| | |
|---|---|
| වෛද්‍ය නලින් ආරියරත්න | - 0714800942 |
| වෛද්‍ය ලසන්ත පිනදාස | - 0773625788 |